Journal of Intangible Cultural Heritage

JICH (2023), Volume 02 (I)

# An Anthropological Study on the Importance of Incest Taboos Associated with Sinhalese Traditional Marriage Customs in Social Control (With special reference to *Aruggammana*)

## සිංහල සමාජයේ සාම්ප්‍රදායික විවාහ චාරිත්‍ර හා බැඳුණු ව්‍යභිචාරී තහංචි, සමාජ පාලනයේදී වැදගත් වන ආකාරය පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක් ( අරුග්ගම්මන ග්‍රාම නිලධාරී වසම ඇසුරිනි)

K. M. S. Samarasekara* and K. J. S. Weerasooriya

Department of Anthropology, Faculty of Humanities and Social Sciences, University of Sri Jayewardenepura, Sri Lanka

**kmssamarasekara@sjp.ac.lk*

## Abstract

*Incest taboos are social ethics that create necessary control over sexual relations, marriage, and the family into which we are born. Marriages between brothers and sisters, parallel cousins, two generations, and blood relatives are all considered incest taboos. Sinhalese society has long used norms and values for social control. These incest taboo restrictions, along with family, marriage, and kinship, have played an important role in maintaining social control. The research problem addresses the loss of social control caused by the non-implementation of kinship, marriage rituals, and courtship restrictions in traditional Sinhalese society due to socio-cultural changes such as urbanization, commercialization, modernization, and westernization. The purpose of the research is to study the relationship between kinship restrictions and social control in marriage rituals. In Kegalle District, Galigamuwa Divisional Secretariat Division, No. 62 Aruggammana Gramaseva domain, a sample of 50 households, representing 15% of the 324 household units, was used for the research. As a descriptive study, data was collected through observation and structured interviews using judgment and random sampling. As the concept of kinship gradually disappeared, it was recognized that extended families made up a smaller percentage, 14%. Due to the increase in the number of nuclear families, extended marriages now account for 78%, while monogamous marriages account for 5%. Premarital sex has increased, with 88% of marriages being based on love, compared to the past. Overall, 10% of the area could be identified with incest taboos. Thus, it can be concluded that in order to control society, the personal control exerted by kinship, incest taboos, and marriage rituals must be re-established. To achieve this, programs should be organized to reaffirm the value of kinship relations and social values. Knowledge about the social values related to sexual and marital relations, especially among young children and youth, should be promoted. This can be effectively done in collaboration with schools and religious shrines.*

***Keywords:*** *Taboos, Incest, Marriage, Social Control, Kinship*

## 1. හැඳින්වීම

සාම්ප්‍රදායික සිංහල සමාජයේ පවුල, විවාහය සහ ඥාතිත්වය සමාජ පැවැත්ම සහතික කිරීම සඳහා විශාල කාර්ය භාරයක් ඉටු කර ඇත. එමඟින් සමාජයේ පුද්ගල සබඳතා ඇතිවිය. පුද්ගල සබඳතාවලදි සිදු නොකළ යුතු, සිදු නොවිය යුතු යැයි සම්මත ක්‍රියා සහ හැසිරීම් ඇත. ඒවා ව්‍යභිචාර (Incent) ලෙස හැඳින්වේ. ඒ හා සම්බන්ධව තහංචි ද ඇත. ව්‍යභිචාරී තහංචි (Incent Taboo) සමාජයේ පවත්නා ධර්මතා සහ අඟනාකම් ලෙස ද හැඳින්විය හැකි ය. ව්‍යභිචාරී තහංචි මඟින් කිසියම් සමාජයක පවතින විවිධාකාර වූ ආයතන සියල්ලෙහිම යම් ලෙසකින් ජීව විද්‍යාත්මක සහ සමාජීය වශයෙන් පාලනයක් ඇති කරයි. සමස්තයක් ලෙෂ ලෝකයේ සියලුම සමාජයන්හි පාහේ එකම පවුලේ සාමාජිකයන් අතර ලිංගික සම්බන්ධතා අනුමත නොකරයි. මෙම සීමා කිරීම් සඳහා ඥාති සබඳතා අදාළ වේ. මෙය අනාචාරයක් ලෙස සිංහල සමාජයේ හඳුන්වන අතර එම යෙදුමෙහි ඉංග්‍රිසි අර්ථය adultery වුවත්, ඉංග්‍රිසියෙහි එය හඳුන්වන්නේ ලතින් වචනයකින් ව්‍යුත්පන්න වී ඇති අපිරිසිදු යන අර්ථය ගෙන දෙන Incest යන පදයෙනි (Satlow, 2020, p.17). සාම්ප්‍රදායික සිංහල සමාජයේ ගණචර්යා වශයෙන් ඇති ව්‍යභිචාරී තහංචි මතින් අවිධිමත් හෝ සමාජීය වශයෙන් පාලනයක් සිදු විය. එය සමාජයක්, සංස්කෘතික වශයෙන් සුරක්ෂිත වීමකි. මෙම ධර්මතා සමාජයෙන් සමාජයට සංස්කෘතියෙන් සංස්කෘතියට වෙනස් වේ. ඕනෑම සමාජයක ඇති පවුල ආදී ප්‍රධාන ආයතන කෘත්‍යාත්මකව හා ව්‍යුහාත්මකව සමාජයේ ඇති අනෙකුත් විවිධ අංශ සමඟ පැහැදිලිවම සම්බන්ධ වේ. එම සම්බන්ධ වීම සිදු වන්නේ ධර්මතා මඟිනි. ඒ අතරින් ජීව විද්‍යාත්මක හා ස්වභාවික හැසිරීම් පාලනය කරන ප්‍රබලම ධර්මතා වර්ගය ලෙස ව්‍යභිචාරී තහංචි හඳුනා ගත හැකි ය.

ජීව විද්‍යාත්මක හා මනෝ විශ්ලේෂණවාදී අදහස් පදනම් කරගනිමින් සිග්මන්ඩ් ෆ්‍රොයිඩ් (Sigmund Freud,1856-1939) ව්‍යභිචාරය පිළිබඳ අදහස් දක්වා ඇත (Fried, 1976: pp. 232-234). ෆ්‍රොයිඩ්ගේ Totem and Taboo (1918) නම් කෘතියෙන් දක්වන ආකාරයට ව්‍යභිචාරය මානව සමාජය ආරම්භය දක්වා දිවයයි. ලිංගික ඊර්ෂ්‍යාව නිසා පුතෙකු විසින් තම පියා මරා, තම මව හා නැගණිය සමඟ ලිංගිකව එක්වී ඇත. එතැන් සිට ව්‍යභිචාරය ප්‍රථම සංස්කෘතික හැසිරීම ලෙස මානව සමාජයට එකතු වූ බවයි ෆ්‍රොයිඩ්ගේ මතය (Davis, 1949: pp. 399-405). ඊඩිපස් හා ඉලෙක්ට්‍රා වශයෙන් සංකීර්ණ දෙකක් ඇසුරින් දෙමාපියන් හා දරුවන් අතර ඇතිවන විරුද්ධ ලිංගික ආකර්ෂණය නිසා ව්‍යභිචාරයත් ඒ නිසාම පියා කෙරෙහි පුතාට ද, මව කෙරෙහි දුවට ද ඇතිවන ලිංගික ඊර්ෂ්‍යාව නිසා බරපතල ගැටළු මතුවීමට හේතුවේ යැයි ද ෆ්‍රොයිඩ් කල්පනා කරයි. මේ මනෝ විද්‍යාත්මක මතවාදය වර්තමානය දක්වාම විවිධ දෘෂ්ටිකෝණයන්ගෙන් සාකච්ඡාවට භාජනය වෙයි.

සමාජීය සත්ත්වයෙකු ලෙස මනුෂ්‍යයාගේ පැවැත්ම තහවුරු වන්නේ සංස්කෘතිය මඟිනි. මනුෂ්‍යයා සංස්කෘතිය ද සමඟින් සියලු දේ ඉගෙනුම ලබයි. එමනිසා ප්‍රජනනය, ලිංගික කටයුතු වැනි ජීව විද්‍යාත්මක අවස්ථා සඳහා ද සමාජ පාලනයක් ඇති කරනු ලබන්නේ මෙම ව්‍යභිචාරී තහංචි මඟිනි. එය මානව පවුල මත ආයතන ගත වී ඇති නිසා එය සුරක්ෂිත කරනුයේ විවාහය හා ඥාතිත්වය යන සංවිධාන ව්‍යුහ මඟිනි. ඥාතීත්වය යනු ලේ සබඳතාව, සහවාසය, සාමාන්‍ය සමාජානුයෝජනය, කුසඹුරු ඒකබද්ධතාව වැනි එකඟතාවයන් හා විවිධත්වයෙන් යුත් සංකීර්ණතා ක්‍රියාවලියක එකතුවකි. එසේම මෙම ඥාතිත්වය සමාජය තුළ පුද්ගලයන් හුදෙකලා වීම වළකනු ලබන පුද්ගල සමුහ එකතුවෙන් සමාජ ජාලයක් නිර්මාණය කරන සාධකයකි (Fox, 1967, p. 12). පවුල් ව්‍යුහය, ඒ හා බැඳුණු සම්බන්ධතා ජාලයට, මනුෂ්‍යයාගේ පැවැත්මට, අන්‍යෝන්‍ය අයිතිවාසිකම් හා යුතුකම් සුරක්ෂිත කිරීමට සැකසුණු මූලික ඝනාචාර පද්ධතියක් ඇත. මේ ඝනාචාර පද්ධතිය 'යුක්ති සහගතබවේ මූලධර්ම' (Principls of Legitimacy) ලෙස හඳුන්වයි (Davis, 1949: pp. 399-405). මේ යුක්තිසහගත බවේ මූලධර්ම මඟින් ප්‍රධාන වශයෙන් ලිංගික සම්බන්ධතා පාලනය කරයි. පිතෘත්වය, මාතෘත්වය හා කුසඹුරුබව පිළිබඳ පැහැදිළි නිර්වචන සපයයි. මේ යුක්ති සහගතබවේ මූලධර්ම උල්ලංඝනය ව්‍යභිචාරයයි (Incest). ඒවා වැලැක්වීමට සංස්කෘතික වශයෙන් වශයෙන් ගොඩණැගී ඇති නිති, ධර්මතා තහංචි (Taboo) ලෙස හැඳින්වේ. ව්‍යභිචාරි තහංචි ලෝකයේ සමාජ කිහිපයක, අවස්තා කිහිපයක හැරෙන්නට සියළු සමාජයන්හි දැකියහැකියි (Crapo, 1993: p. 185). පුද්ගලයන් අතර ඇති ලිංගික සබඳතා පාලනය කිරීමට අවශ්‍ය මූලික ව්‍යුහය පදනම්ව ඇත්තේ පවුල තුළ ය. ව්‍යභිචාරයන්ගෙන් වළකා තහංචි ක්‍රියාත්මක වීම පවුල, විවාහය හා ඥාතිත්වය යන මූලික ආයතන හරහා සිදුවෙයි..

### 1.1 අවිධිමත් සමාජ පාලන උපක්‍රම අතර ව්‍යභිචාරී තහංචි.

අවිධිමත් සමාජ පාලන උපක්‍රම යනු ධර්මතා මඟින් සිදුවන සමාජ පාලනය යි. කිසියම් ජන සමාජයක ජීවත්වන්නන්ට කළ යුතු දේ, නොකළ යුතු දේ කුමක්දැයි කියාදෙන්නේ ධර්මතා මඟිනි. ධර්මතා සමාජයෙන් සමාජයට වෙනස් වෙයි. ධර්මතා පවතින්නේ සමාජයේ ඇති විවිධ ආයතන සංවිධාන පදනම් කරගෙන යි. යම් සමාජ අවස්ථාවකදි හැසිරිය යුතු ආකාරය, කෙනෙකු සමඟ සම්බන්ධතා දැක්විය යුත්තේ කෙසේ ද, යම් දෙයක් පරිහරණය කළ යුතු ආකාරය, තීරණය කරන්නේ ධර්මතා මඟිනි. අදාළ සමාජය ප්‍රාථමික හෝ ගැමි සමාජයක් ද, නාගරික, සංකීර්ණ සමාජයක් ද යන්න මත ධර්මතාවල ස්වරූපය වෙනස් වෙයි. උදාහරණයක් වශයෙන් විවාහය සම්බන්ධ තීර්ණ ගැනීමේදි මේ එක් එක් සමාජවල එකිනෙකට වෙනස් ධර්මතා අනුව සිදු කරයි. සමාජ පාලනයේදි ධර්මතාවල වැදගත්කම අතිවිශාල ය (සමරසේකර, 2005, පි.67). ධර්මතා සෑම සරල, සංකීර්ණ, නාගරික, ග්‍රාමීය මෙන්ම ප්‍රාථමික සමාජවල දැකගත හැකි ය. එමගින් කළ යුතු දේ, නොකළ යුතු දේ මෙන්ම පැවැත්විය යුතු, නොපැවැත්විය යුතු සබඳතා පිළිබඳව සමාජය දැනුවත් කරමින් පුද්ගලයා මෙන්ම සමාජය ද ස්වයං පාලනයක් සිදු කරයි. ධර්මතාවලට අනුගත වීමෙන් සමාජය ආරක්ෂාකාරී වේ. එමඟින් සමාජය නිරායාසයෙන් පාලනය වීම එයට හේතුව යි. ධර්මතා ආරක්ෂා නොකිරීම හරහා සමාජය තුළ අපකීර්තියට, අසහනයට, දඬුවමට ලක් වේ. එයට හේතුව එලෙස නොවීමෙන් ඒ හරහා සිදුවන සමාජ පාලනය ගිලිහී සමාජයේ සහාත්වය වියැකී යන නිසා ය. ඥාතින් අතර පමණක් නොව ඥාතීන් නොවන අය අතර ද හිතුමතේ ලිංගිකව හැසිරීමට ඉඩක් නැත. එනම්□ නිවස තුළ හෝ අදාළ ස්ථානයක යම් තත්ත්වයක් දරන, කාර්යයක් පැවරුණු (දරුවන් බලාගන්නා, ගෘහ සේවයේ යෙදෙන, කාර්යාලයේ තමන් යටතේ හෝ ඉහළින් හෝ එකට සේවය කරන ආදී වශයෙන්) අය අතර අසම්මත ලිංගික ඇසුර Mismating හෝ Status Unchastity ලෙස හඳුන්වයි (Schusky, 1965: P 76).

සමාජ ධර්මතා යනුවෙන් හැඳින්වෙන්නේ කිසියම් සමාජයක සාමාජිකයන් විසින් පොදුවේ අනුගමනය කරනු ලබන හෝ අනුගමනය කරනු ඇතැයි බලාපොරොත්තු වන පිළිගත් හැසිරීම් ය. එමෙන්ම මෙහි දි අප විශේෂයෙන් මතක තබා ගත යුතු කරුණක් නම් සමාජ ධර්මතා යන පදයෙන් කියවෙන්නේ සමාජයේ සාමාජිකයන්ගෙන් බලාපොරොත්තු වන සම්මත හැසිරීම් රටා යන්න ය. මෙහිදී ජනචර්යා (Folk- Ways), ගණාචාර (Mores), නීත්‍යානුකූල (Legal) හා සංස්ථාගත (Institutional) වශයෙන් සැලකෙන හැසිරීම් රටා වැදගත් වන්නේ ය (පල්ලියගුරු, 2003, පි. 16). ධර්මතා මඟින් සමාජයේ සාමාජිකයන්ගේ හැසිරීම්, සිතුම් පැතුම් සඳහා ප්‍රතිචාර දක්වයි. හොඳ නරක, විශ්වාස, සිරිත් විරිත් මෙන්ම සමාජයේ ව්‍යුහාත්මක හා සංවිධානාත්මකබව තීරණය කිරීම සඳහා සමාජ ධර්මතා විශාල කාර්ය භාරයක් ඉටු කරයි. ධර්මතා පදනම් කරගනිමින් සමාජ සංවිධානය අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකියාව ලැබේ. ධර්මතාවලට අනුව හැසිරීම හරහා එවැනි හැසිරීම් මඟින් සමාජ පාලනය (Social Control) සිදු වේ. අවිධිමත් සමාජ පාලන උපක්‍රම අතර ප්‍රධාන තැනක් ගන්නේ ව්‍යභිචාරී තහංචියි. ඒවා සෑමවිටම පැනවෙන්නේ ලිංගික සබඳතා පදනම් කරගෙන යි.

#### ලිංගික සබඳතා සඳහා වන තහංචි

ලිංගික සබඳතා යනු මිනිසාගේ ප්‍රාථමික අවශ්‍යතාවයන් ය. එවැනි සබඳතාවලට යම්කිසි පාලනයක් අවශ්‍ය වේ. එසේ නොමැති වූ විට සමාජය තුළ අසම්මත සබඳතා බහුල වේ. මිනිසා අනාචාරයේ යෙදීමෙන් සත්ත්වයෙකු වැනි තත්ත්වයකට පත් වේ. එම නිසා මනුෂ්‍යයා තුළ අනාචාරය තහනම් කර ඇත. එලෙස තහනම් නොකළහොත් මිනිසා දැඩි ලෙස අනාචාරයේ යෙදෙනු ඇතැයි උපකල්පනය කළ හැකි ය (Fox, 1967, p.56). සෑම මිනිස් සමාජයක ම ලිංගික සබඳතා පැවැත්වීම පිළිබඳව බල පවත්වන නීතින් අතර ව්‍යභිචාරී තහංචි (Incent Taboo) මඟින් ඉටු කරනුයේ වැදගත් කාර්ය භාරයකි. මෙයින් අදහස් වනුයේ පවුලේ ලේ ඥාතීන් අතර විවාහ සම්බන්ධතා පැවැත්වීම තහනමක් වශයෙන් ක්‍රියාත්මකවීමයි. මෙහිදි නිශ්චිත වශයෙන් ලිංගික සම්බන්ධතා පැවැත්විය යුතු අය කවරේ ද යන්නත් නොපැවැත්විය යුතු ඥාතීන් කවරේ ද යන්නත් පිළිබඳව සිරිත් විරිත් දක්නට ලැබේ. මෙයම වෙනත් ප්‍රකාශයක් වශයෙන් ඉදිරිපත් කළහොත් ඇතැම් සමාජවල එක් වර්ගයක ලේ ඥාතීන් සමඟ ලිංගික සබඳතා පැවැත්විය හැකි ය. තවත් වර්ගයක ලේ ඥාතීන් සමඟ ලිංගික සබඳතා පැවැත්වීම තහනම් වේ. මෙම තහනම හේතු කොට ගෙන අනිවාර්යයෙන්ම සමහර කිට්ටුවර ඥාතීන් සමඟ විවාහ සබඳතා පැවැත්මක් සිදු නොවේ (හේරත්, 1999, පි.50). පවුලේ ලේ ඥාතීන් අතර ලිංගික සබඳතා මෙන් ම විවාහ සබඳතා පැවැත්වීම ව්‍යභිචාරයකි. මේ සඳහා සමාජයෙන් තහංචි පනවා ඇත. ව්‍යභිචාරයන් සිදු කිරීම අනාචාරයේ

හැසිරීමක් ලෙස සලකයි. මෙම අනාචාරී හැසිරීම් පාලනය කරමින් පුද්ගලයා තුළ ස්වයං පාලනයක් ඇති කිරීමට ව්‍යභිචාරී තහංචි මඟින් හැකියාව ලැබේ. කෙසේ වෙතත්, සමීපතම පවුලේ සාමාජිකයන්ට ඇති අනියම් සම්බන්ධතා තහනම් විශාල ලෙස වෙනස් විය හැකි ය.

## පූර්ව වෛවාහික ලිංගික සබඳතා සඳහා වන තහංචි

ව්‍යභිචාරී තහංචි ගැන සාකච්ඡා කරන විට පූර්ව වෛවාහික ලිංගික සබඳතා පැවැත්වීම සාකච්ඡාවෙන් බැහැර කළ හැක්කේ නොවේ. ආදිතම සමාජයේ පටන් අද්‍යතන සමාජය දක්වා සෑම සමාජයක ම, සෑම සමාජ ස්තරායණයක ම සම්බන්ධතා පැවැත්වීම සිදු වූ බවත්, සිදුවන බවත් මානව විද්‍යාඥයන්ගේ හා සමාජ විද්‍යාඥයන්ගේ පිළිගැනීම ය. ඇතැම් සමාජවල පූර්ව වෛවාහික ලිංගික සම්බන්ධතා පැවැත්වීම ස්ත්‍රී පක්ෂයට මෙන්ම පුරුෂ පක්ෂයට ද තහනම් ය. ඇතැම් සමාජවල තහනම් නොවේ. මෙහිදී පුරුෂ පක්ෂයට වඩා ස්ත්‍රී පක්ෂයට තහනම් නීතියට යටත්ව පසුවන බව දක්නට හැකි ය. තරුණ තරුණියන් වැඩිවිය පැමිණෙන අවස්ථාවලදී ද්වාරකර්ම ආදි පිළිවෙත් පවත්වන්නේ උත්සව පවත්වන්නේ එම කරුණ සංකේතවත් කිරීම පිණිස ය. දැරියකගේ උපතේ පටන් ම ඇයගේ ලැජ්ජාශීලී භාවයක්, ඇතිවන ශාරීරික වෙනස්කම් කෙරෙහි වෙසෙසින් මව සැලකිලිමත් වන්නී ය. කරුණු වටහා දෙන්නී ය. දැනුවත් කරන්නී ය. යුවතියගේ කන්‍යාභාවයත්, විවාහයෙන් පසු පතිවතත්, රැක ගැනීමෙන් පවිත්‍රව ජීවත්වීමට උගන්වන්නී ය. පවුලේ අනෙක් වැඩිහිටියන්ගේ ද නොයෙකුත් අවවාද අනුශාසනා උපදෙස් ලැබෙන්නේ ය (අබේසුන්දර, 2002, පිටු.65-66). පූර්ව වෛවාහික ලිංගික සබඳතා පිළිබඳ රීතීන් හා තහංචි සෑම සමාජයකම එකම ආකාරයෙන් ක්‍රියාත්මක නොවේ. එයට හේතුව නම් සමාජයෙන් සමාජයට සංස්කෘතීන්වල ඇති විවිධත්වය නිසා ය. ඇතැම් සමාජවල කාන්තාවන්ගේ පමණක් පූර්ව වෛවාහික ලිංගික සබඳතා පිළිබඳව සැලකිලිමත් වන අතර, තවත් සමාජවල පුරුෂයන්ගේ ද පූර්ව වෛවාහික ලිංගික සබඳතා පිළිබඳව සැලකිලිමත් වේ. බටහිර සමාජවල පූර්ව වෛවාහික ලිංගික සබඳතා පිළිබඳ ව වැඩි අවධානයක් යොමු නොකරයි. එම රටවල සැලකිලිමත් වන්නේ තමාට ලිංගික තෘප්තිය හොඳින් ම ලබාදෙන සහකරු හෝ සහකාරිය තෝරා ගැනීම පිළිබඳවයි. ඒ සඳහා එම රටවල විවාහයට පෙර ගෘහීය එකතුව එනම් Living together සංකල්පය ක්‍රියාත්මක වේ. වර්තමානය වන විට සිංහල සමාජය බටහිරකරණය වීම හා සංස්කෘතික විසරණය හරහා මෙම සංකල්ප ව්‍යාප්ත වී ඇත. එමඟින් ව්‍යභිචාරී සබඳතා ඇතිවීම වර්තමානය වන විට බහුල වී ඇත.

## අනියම් ලිංගික සම්බන්ධතා සඳහා වු තහංචි

සාම්ප්‍රදායික සිංහල සමාජය අනියම් ස්ත්‍රී පුරුෂ සබඳතා අනුමත නොකළ බව පැහැදිලි කරුණකි. සහ ලේ ඥාතීන් අතර වන ලිංගික සබඳතාව ව්‍යභිචාරයක් සේ තරයේ ගැනුණු අතර එය පාපිෂ්ඨ දෙයක් නැතහොත් තිරිසන් ගතියක් සේ සලකන ලදී (ආරියපාල, 1996, පිටු.291-292). ව්‍යභිචාරී සබඳතා අතර අනියම් ලිංගික සබඳතා ද සමාජය අනුමත නොකරන හැසිරීම් රටාවකි. වර්තමාන සමාජයේ බහුලවම දැකගත හැකි සමාජ සම්මත බිඳ දමන අවස්ථාවන් ලෙස අනියම් ලිංගික ඇසුර ක්‍රියාත්මක වේ. මෙමඟින් පවුල් තුළ විවිධ ගැටලු රැසක් නිර්මාණය වේ. පවුල හා ඥාතිත්ව රටා වෙනස් වී සමාජ ව්‍යුහය හා සමාජ පැවැත්ම සඳහා මෙය අහිතකර වේ. ව්‍යභිචාරී තහංචිවල අදවන විට ඇති ලිහිල් බව හේතුවෙන් මෙවැනි සමාජ අසම්මත අවස්ථා බහුල වී ඇත.

සිංහල සමාජයේ මහනුවර යුගයෙහි මෙවැනි තහනම් සබඳතා අසු වූ විට ඔවුන් මරා දමනු ලැබූ බව වාර්තා වී ඇත (පීරිස්, 2012, පි.210). එනම්, ලෝකයේ බොහෝ සමාජවල මෙන්ම සිංහල සමාජය තුළ ද මෙවැනි ව්‍යභිචාරී ලිංගික සබඳතා අතීතයේ සිටම ක්‍රියාත්මක වී ඇති බව පැහැදිලි වේ. මධ්‍යතන යුගයේ දී බහුභාර්යා හෝ බහුපුරුෂ සේවනය විරල වශයෙන් සිදුවන්නට ඇති බවට අසන්නට ලැබේ. සද්ධර්මරත්නාවලියේ කාලි යකින්නගේ වස්තුවෙහි පළමුවන බිරිය වඳ බැවින් දෙවන බිරියක කැඳවාගෙන ඒමක් සඳහන් ය. බහුපුරුෂ සේවනය හෙවත් ''එකගෙයි කෑම'' සමාජ සම්මුතියක් ලෙස මහනුවර යුගයේ දී උඩරට මෙන්ම පහතරට පළාත්වල ද ක්‍රියාත්මක විය. බහු ස්ත්‍රී විවාහ එතරම් ප්‍රකට නැත (පීරිස්, 2012, පිටු.215-222). එනම් එකගෙයි කෑම වැනි සමාජ සම්මතය ඇති අවස්ථාවක දි හැර අන් අවස්ථාවලදි විවාහක ස්ත්‍රීයට හෝ පුරුෂයාට අමතරව පරපුරුෂ හෝ පරස්ත්‍රී සේවනය කිරීම අතීත සමාජය පිළිකුල් කර ඒ සඳහා මරණීය දණ්ඩනය පවා ලබා දී ඇත.

**විවාහ චාරිත්‍ර පදනම් කරගත් තහංචි**

විවාහය නම් ආයතනය නිරන්තරයෙන් වෙනස්වීමට ලක් වන්නකි. ලිංගික හැසිරීම් සංවිධානය කිරීම, පාලනය කිරීම, ප්‍රජනනය සහ දෛනික ජීවිතයේ කර්තව්‍යය සඳහා ස්ථාවර ව්‍යුහයක් සැපයීමේ මාර්ගයක් ලෙස විවාහය හැඳින්විය හැක. "විවාහය යනු පුරුෂයෙකු හා ස්ත්‍රියක් අතර ඇති බැඳීමකි, එවිට ස්ත්‍රියට උපදින දරුවන් සහකරුවන් දෙදෙනාගේම නීත්‍යානුකූල දරුවන් ලෙස පිළිගැනේ" (Routine, 1951, p.111). ලිංගිකත්වය විවාහය සමඟ ඒකාබද්ධ වී ඇති අතර, ප්‍රථම වරට ලිංගිකව එක් වීම සිදු වන්නේ විවාහ ජීවිතයේ ආරම්භයත් සමඟ ය. එය සිදු වන්නේ සහජ ආශාවට නොව සංස්කෘතික වශයෙන් ප්‍රතිචාර දැක්වීමක් ලෙසයි (Pritchard,1951,p.50). විවාහය පවත්වාගෙන යාමට විධිමත් කොන්දේසි මෙන්ම, එම ආයතනය අසාර්ථක වූ විට, එය විසුරුවා හැරීමට ඉඩ සලසන කොන්දේසි ද නීතිය විසින් විග්‍රහ කරනු ලබයි. (Dominian, 1968, p.17). මිනිස් සංහතියේ පැවැත්ම තහවුරු කර ගැනීම සඳහා එය ඉතා වැදගත් කොට සැලකේ. මිනිස් ජීවිතයේ අපූර්ව ම සබඳතාවය ලෙස විවාහය පිළිබඳ ව අර්ථ ගැන්විය හැකි ය.

සමාජයෙන් සමාජයට මෙම සාධක වෙනස් වන අතර ලෝකයේ සැම සමාජයන්ට ම පොදු සමාජ සම්මත, ධර්මතා හා තහංචි ක්‍රියාත්මක වේ. නිදසුනක් ලෙස පියා සහ දියණිය, මව සහ පුතා අතර ලිංගික සබඳතා පැවැත්වීම මෙන්ම විවාහ සිදු කිරීම විශ්ව සාධාරණ තහනම් නීති වේ. දරුවන් අතර ලිංගික සබඳතා ද තහනම් ය. කෙසේ නමුත් මිථ්‍යා කථා හා ජනප්‍රවාදයන්හි මෙවැනි විවාහ සම්බන්ධතා දක්නට ලැබේ (Ogburn & Nimkoff, 1947, p.462). එම නීති සිංහල සමාජයට ද පොදු ය (Ariyapala, 1954, p.299). ස්මෘති ග්‍රන්ථ අතර සමහර සමගෝත්‍ර සහ ප්‍රතිගෝත්‍ර විවාහ පිළිබඳ නීතිරීති හඳුන්වා දෙයි. ඊට අනුව සගෝත්‍ර, සපිණ්ඩ, සප්‍රවර විවාහ තහනම් ය (හෙට්ටිආරච්චි, 2008, පි.71). අතීතයේ සිංහල සමාජයේ ඇවැස්ස ඥාති විවාහය (පියාගේ සහෝදරියගේ දරුවන් සමඟ කරන විවාහය හා මවගේ සහොදරයාගේ දරුවන් සමඟ කරන විවාහය) නැනා සහ මස්සිනා අතර විවාහය සුදුසු යැයි පිළිගන්නා ලද අතර ඥාති සහෝදර සහෝදරියන් අතර විවාහය (පියාගේ සහෝදරයාගේ දරුවන් හා මවගේ සහෝදරියගේ දරුවන් සමඟ කරන විවාහය) තහනම් වූ නිසා සමගෝත්‍ර විවාහය ලංකාවේ ද තහනම් විය. ඥාති විවාහය සමහර සංස්කෘතීන් තුළ යෝග්‍ය ලෙස සලකනු ලැබේ, නමුත් අනෙක් අය විසින් අනියම් සබඳතා ලෙස තහනම් කර ඇත.

බටහිර රැඩිකල් සමාජ සහ තාක්ෂණික වෙනස්කම්වල බලපෑමෙන් පැරණි විවාහ චාරිත්‍ර ක්‍රම වෙනස් වී ගොස් ඇත (Simpson, 1999, p.2). ඒ අනුව විවාහය සඳහා පෙළපත, ගෝත්‍රය, කුලය, ජාතිය යටතේ තීරණ ගත්ත ද වර්තමානයේ සමූහයේ ධනය, වත්කම්, නීති සහ ක්‍රියා, බලය සහ පෙළපත වෙත යොමු වී තීරණ ගැනීම විවාහය යි (Bell, 1988, p.3). එනම් වර්තමානය වන විට විවාහ චාරිත්‍ර අතීතයට සාපේක්ෂව වෙනස් වී ඇති බව පෙනේ. ඒ අනුව විවාහ චාරිත්‍රවල එන ව්‍යභිචාරී තහංචි මඟින් සමාජ පාලනයේ දි විශාල කාර්ය භාරයක් ඉටු කරනු ලබයි. එය ඉහත න්‍යායාත්මක කරුණු මඟින් මනාව පැහැදිලි වේ.

## 1.2 පර්යේෂණ ගැටලුව

සාම්ප්‍රදායික සිංහල සමාජය කලක් තිස්සේ සමාජ පාලනයේදි ධර්මතා සහ අඟනාකම් යොදාගෙන පාලනය සිදුවිය. එම පාලනය ඇති කිරීමේදි ව්‍යභිචාරී තහංචි, පවුල, විවාහය හා ඥාතිත්වය සමාජ පාලනයෙහි ලා වැදගත් කාර්ය භාර්යක් ඉටු කරන ලදී. නමුත් නාගරිකකරණය, වාණිජකරණය, නවීකරණය, බටහිරකරණය වැනි සමාජ සංස්කෘතික වෙනස්වීමේ බලවේග ඔස්සේ සාම්ප්‍රදායික සිංහල සමාජයේ ක්‍රියාත්මක වූ ඥාතිත්වය, විවාහ චාරිත්‍ර හා ව්‍යභිචාරී තහංචි ක්‍රියාත්මක නොවීමෙන් ඒ හරහා සිදු වූ සමාජ පාලනය ගිලිහී ඇත. මෙම පර්යේෂණයෙන් අධ්‍යයනය කරනු ලබන්නේ ඒ පිළිබඳව යි.

## 1.3 පර්යේෂණ අරමුණු

ප්‍රධාන අරමුණ වන්නේ විවාහ චාරිත්‍රවල එන ව්‍යභිචාරී තහංචි සහ සමාජ පාලනය අතර සම්බන්ධතාව පිළිබඳ අධ්‍යයනය කිරීම යි. සෙසු අරමුණු ලෙස ව්‍යභිචාරී තහංචි සහ විවාහ චාරිත්‍ර වත්මන් සමාජයෙන් ක්‍රමයෙන් වියැකී යන ස්වභාවයක් ගැනීමට හේතු පිළිබඳ විමර්ශනය කිරීම, සාම්ප්‍රදායික සිංහල සමාජයේ විවාහ වර්ග, විවාහ චාරිත්‍ර සහ විවාහ රීතීන් පිළිබඳ විවරණය කිරීම, අතීතය හා සැසඳීමේ දී වර්තමානය වන විට විවාහ චාරිත්‍රවල සිදුව ඇති වෙනස පිළිබඳ

අධ්‍යයනය කිරීම, වියැකී යන ව්‍යභිචාරී තහංචි ඔස්සේ සමාජයෙන් ගිලිහී යන ඥාතිත්ව සංකල්පයෙහි ඇති වැදගත්කම පිළිබඳ අධ්‍යයනය කිරීම සහ මේ සියලු චාරිත්‍ර ඔස්සේ සිදුවන සමාජ පාලනය පිළිබඳ අධ්‍යයනය කිරීම තුළින් ඒ පිළිබඳ සමාජයට හෙළි කිරීම යන ඒවා දැක්විය හැකි ය.

## 2. පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය මගින් සොයා බලන්නේ සාම්ප්‍රදායික ව්‍යභිචාරී රීතීන් සහ ඒවායේ වෙනස්වීම පිළිබඳව යි. එමගින් සිදුවන සමාජ සංස්කෘතික වෙනස්වීම හා එහි ප්‍රතිවිපාක ද විමසා බැලෙති. ව්‍යවහාරික මානව විද්‍යාත්මක න්‍යාය හා ක්‍රමවේද යටතේ සිදුකරන මෙම පර්යේෂණය සිදුකරන්නේ විවරණාත්මක පර්යේෂණ (Explanation Research) ලෙසට යි. විවරණාත්මක පර්යේෂණ යනු යම් සිද්ධියක්, සමාජයක් හෝ යම් දෙයක් පිළිබඳව කරුණු එක්කොට විවරණයක යෙදීම වේ. උචිත මූලාශ්‍ර තෝරාගැනීම, දත්ත එකතු කිරීමට උපයෝගී කරගන්නා ක්‍රමය හා මාර්ග මෙන්ම දත්ත වර්ගීකරණය කරන මාර්ග පැහැදිලිව දැක්වීම, දත්ත රැස්කිරීමට තෝරාගත් ක්‍රමවල ඇති උචිත සහ නිරවද්‍යතාවය සහ දත්ත විග්‍රහය හා විවරණයෙන් අනතුරුව නිගමන ලිඛිල් බසින් දැක්වීම මෙහි විශේෂත්වය යි. මෙම පර්යේෂණය සඳහා ලිඛිත ප්‍රාථමික හා ද්විතීයික හා අලිඛිත ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය යොදා ගෙන ඇත.


මෙම පර්යේෂණයේ අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාමසේවා වසම් අතරින් අංක 62 අරුග්ගම්මන ග්‍රාමසේවා වසම යොදා ගැනුණි. එම වසමට අයත් ගෘහස්ථ ඒකක 324කින් 15%ක් වන පරිදි ගෘහස්ථ 50ක් නියැදිය වශයෙන් ගෙන ඇත. මෙ සඳහා විනිශ්චය නියැදිය හා අහඹු නියැදිය යටතේ දත්ත දායකයන් තෝරා ගනු ලැබුණි. දත්තරැස් කිරීමේ ක්‍රමවේදයන් වශයෙන් නිරීක්ෂණ, සම්මුඛ සාකච්ඡා යන ක්‍රමවේදයන් භාවිතා කෙරිණි. නිරීක්ෂණය මඟින් දත්ත දායකයන්ගේ හැසිරීම සහ අභිනයන් පහසුවෙන් වාර්තා කර ගැනීමට හැකි විය. අකෘතිමය සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදය මගින් සිදු වනුයේ සම්මුඛ පරීක්ෂණ උපලේඛනයක් යොදාගෙන දත්ත දායකයා වෙතින් අවශ්‍ය දත්ත ලබා ගැනීම යි. මෙම පර්යේෂණයේදී අධ්‍යයනය කරනු ලබන විවාහය, ව්‍යභිචාරී තහංචි සහ සමාජ පාලනය පිළිබඳ ව අධ්‍යයනයට මෙම ක්‍රමවේදයන් මනාව උපයුක්ත වූ බව සඳහන් කළ හැකි ය. මෙම පර්යේෂණයෙන් ලබා ගත් දත්ත විශ්ලේෂණය සඳහා වගු, ප්‍රස්තාර, සටහන් යොදා ගැනීම සිදු කළ අතර, එමෙන්ම දත්ත විශ්ලේෂණය සඳහා පරිගණක මෘදුකාංග භාවිත කෙරිණි.

## 3. ප්‍රතිඵල හා සාකච්ඡාව

නියැදියට අයත් පවුල් ඒකකවල මූලික තොරතුරු, විවාහ සබඳතාවල ස්වභාවය, විවාහය සඳහා සමාජයේ පවතින තහංචි හා ඒවායේ අතීත, වර්තමාන තත්ත්වය, ව්‍යභිචාරී තහංචි පිළිබඳ සමාජයේ ඇති දැනුවත්භාවය, තහංචිවලින් සමාජයට ඉටුවන කාර්යභාර්යය පිළිබඳ දත්ත දායකයන් ඉදිරිපත් කළ අදහස් හා යෝජනා ආදිය මෙහි දි විමසුමට ලක් කරනු ඇත. නියැදියේ පවුල් ඒකක 50 හි සමස්ත සාමාජිකයින් සංඛ්‍යාව 224 කි. පවුල් ඒකක 50න් 69%ක් ප්‍රදේශයේ මුල් පදිංචිකරුවන් ය. පවුල් ඒකකයන්හි සාමාජිකයන් ප්‍රතිශත ඇසුරෙන් දැක්වුවහොත් වැඩි ප්‍රතිශතයක් පෙන්නුම් කරන්නේ සාමාජිකයන් පස් දෙනෙකු සිටින පවුල් ය. එහි ප්‍රතිශතය 31% කි. එමෙන්ම සාමාජිකයන් හය දෙනෙක් සිටින පවුල් ප්‍රතිශතයක් වශයෙන් 27% කි. සාමාජිකයන් ගණන තිදෙනෙක් සහ සිව් දෙනෙක් සිටින පවුල් ඒකක ගණන ප්‍රතිශතයක් ලෙස පිළිවෙළින් 10% හා 18% කි. 4% ක ප්‍රතිශතයකින් සාමාජිකයන් දෙදෙනෙකු සහ සාමාජිකයන් එක් අයෙක් සිටින පවුල් ඒකක ප්‍රතිශතය 2% කි. ඒ අනුව පෙනී යන්නේ වර්තමානය වන විට පවුලක සාමාජිකයන් සංඛ්‍යාව සීමා වී ඇති බව ය. න්‍යෂ්ටික පවුල් 36 ක් අධ්‍යයන නියැදිය තුළ වූ අතර එය ප්‍රතිශතයක් වශයෙන් 68% කි. එමෙන්ම සංකීර්ණ න්‍යෂ්ටික පවුල් 18% ක ප්‍රතිශතයක් පෙන්නුම් කරයි. එමෙන් ම විස්තෘත පවුල් 6 ක් අධ්‍යයන නියැදියට අඩංගු වේ එය ප්‍රතිශතයක් ලෙස 14% කි. මේවායේ න්‍යෂ්ටික පවුල් ඒකක ද්විත්වයක් හෝ ඊට වඩා ජීවත් වන අතර පරම්පරා තුනක් ජීවත් වීම දක්නට ලැබිණි. 68% වූ වැඩි ප්‍රතිශතයක් න්‍යෂ්ටික පවුල් ඒකකයන් නිරූපණය වන අතර ඒ අනුව අධ්‍යයන ප්‍රදේශයේ න්‍යෂ්ටික පවුල් වැඩි ප්‍රතිශතයක් වේ.

අධ්‍යයන ප්‍රදේශයේ විවාහ සම්බන්ධතාව ගත් විට සුවිශේෂී ලක්ෂණයක් ඇතුළත් වේ. අතීතයේ පැවති විවාහ ක්‍රම නූතනයේ ද බහුලව ව්‍යාප්ත වී නැතත්, අතරින් පතර හෝ දැක ගැනීමට හැකියාවක් ලැබුණි. ඒ අතුරින් දීග විවාහය, බින්න විවාහය හා එකගෙයි විවාහය යන විවාහ ක්‍රම දැකගත හැකිය. දීග විවාහ සාමාජිකයන් 78% ක ප්‍රතිශතයකි. එනම්, වැඩිම ප්‍රතිශතයක් ඇත්තේ

දීග විවාහකයන් ය. බින්න විවාහය ද සැලකිය යුතු මට්ටමකින් ඇත. එනම්, 17% ක ප්‍රතිශතයකි. පිරිමි සහෝදරයෙකු නැති හෝ පවුලේ එකම දරුවා ලෙස ගැහැණු දරුවන් සිටින පවුල්වල තම පවුලට සුදුසු පුද්ගලයෙකු තෝරාගෙන එම විවාහ කටයුතු කරගෙන ඇත. එකගෙයි කෑම විවාහ ක්‍රමය සඳහා 5% ක ප්‍රතිශතයක් දැක ගැනීමට හැකි විය. සහෝදරයන් කීප දෙනෙකු සිටින පවුලක එක බිරිඳක් කැන්දාගෙන ඒම මෙහි දී සිදු වේ. මෙම විවාහ ක්‍රමයන් යටතේ සිදු වූ ඇවැස්ස විවාහයන් පිළිබඳව ද මෙහි දී සාකච්ඡා කිරීමට හැකියාවක් ඇත. එහිදී දීග විවාහකයන් අතුරින් ඇවැස්ස විවාහකයන් 5 ක් හමු විය. ප්‍රතිශතයක් ලෙස එය 3% කි. බින්න විවාහකයන් අතුරින් ඇවැස්ස විවාහකයන් 3 කි. ප්‍රතිශතයක් ලෙස එය 1.9% කි. එකගෙයි කෑම විවාහ අතරින් ඇවැස්ස විවාහකයෙක් හමු විය. ප්‍රතිශතයක් ලෙස එය 0.6 කි. අලුතින් ඇවැස්ස ඥාති විවාහය ආරම්භ වී නැතත් පළමු හෝ දෙවන පරම්පරාවල ඇතැම් සාමාජිකයන් කීප දෙනෙක් අතර සිදු වූ ඇවැස්ස ඥාති විවාහ වර්තමානයේ දැකගත හැකි විය.





**රූපසටහන 1.** වර්තමානයේ ප්‍රදේශයේ විවාහය සිදුවන ආකාරය

අතීතයේ අධ්‍යයන ප්‍රදේශයේ 78% ක්ම යෝජිත විවාහ සිදු වී ඇත. එමෙන්ම 22% ක ප්‍රතිශතයකින් ආදර සබඳතා විවාහ සිදු වී ඇති බව පෙන්වා දිය හැක. නමුත් වර්තමානය වන විට සමාජ සංස්කෘතික වෙනස්වීමේ බලවේගයන් ඔස්සේ ආදර සබඳතා මත පදනම් වූ විවාහයන් 88%ක ප්‍රතිශතයක් ගෙන ඇත. යෝජිත විවාහ 12% ක් පමණ වර්තමානයේ සිදුවන බව දැකගත හැකි ය. කපු මහතා හරහා විවාහ යෝජනා ගෙන ඒම වර්තමානය වන විට 6% ප්‍රතිශතයක් ගනී. එයට හේතුව ලෙස ඔවුන් දක්වන්නේ වර්තමානයේ විවාහ යෝජනා කපු මහතා පමණක් නොව,

නෑදෑයන්, යහළුවන්, මංගල කිංකිණි දැන්වීම්, දුරකථනය, පරිගණකය හරහා මෙන්ම මංගල යෝජනා සහිත වෙබ් අඩවි පවා වර්තමානයේ නිර්මාණය වී ඇති බව යි. එනම්, 6% ක් කපු මහතාගේ මාර්ගයෙනුත්, 12% ක් මංගල කිංකිණි හරහාත්, 17% ක් යහළුවන් සහ නෑදෑයන් හරහාත් විවාහ යෝජනා ලැබී විවාහ වී ඇත. මෙහිදි විශේෂයෙන් පෙන්වා දිය යුත්තේ නව තාක්ෂණික ක්‍රම හරහා ඇතිවන විවාහ යෝජනාවන් ය. වැඩිම ප්‍රතිශතයක් ගන්නේ ද එම යෝජනාවන් ය. එය 65% ක ප්‍රතිශතයකි. මීට අමතරව ආදර සබඳතා හරහා ඇතිවන විවාහ සබඳතා සඳහා දෙමව්පියන්ගේ කැමැත්ත අකමැත්ත පිළිබඳව ද කතාකළ යුතු වේ සමස්තයක් ලෙස ගත් කළ 89% ක ප්‍රතිශතයකට මව්පියන්ගේ ආශිර්වාදය හිමි වේ. 11% ක ප්‍රතිශතයක් සඳහා දෙමව්පිය අකමැත්ත ලැබී ඇත. අතීතයට සාපේක්ෂව වර්තමානය වන විට ආදර සබඳතා සඳහා දෙමව්පිය කැමැත්ත දක්නට ලැබේ.

වර්තමානයේ අධ්‍යයන ප්‍රදේශයේ දත්ත දායකයන්ගේ හඳහන් බැලීමේ අවශ්‍යතාව පිළිබඳ මතය විමසීමේ දී හඳහන් බැලීමට අවශ්‍යය යැයි අදහස් දැක් වූ පිරිස 41% ක් ද, හඳහන් බැලීමට අවශ්‍ය නොවේ යැයි අදහස් දැක් වූ පිරිස 59% ක් විය. ඒ අනුව වැඩි පිරිසක් හඳහන් බැලීමට අවශ්‍ය නොවේ යැයි අදහස් දක්වන ලදි. කන්‍යාභාවය පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් ගත්කල අධ්‍යයන නියැදියේ දත්ත දායකයන් 63% ක වැඩි ප්‍රතිශතයක් අදහස් දැක්වූයේ කන්‍යාභාවය පරීක්ෂා කිරීම අවශ්‍ය නොවන බව යි. එමෙන්ම 37% ක ප්‍රතිශතයක් කන්‍යාභාවය පරීක්ෂා කර බැලීම අත්‍යවශ්‍ය සාධකයක් බවත් අදහස් දක්වන ලදී. කන්‍යාභාවය පරීක්ෂා කිරීම නිසා අතීතයේ තරුණියන් තම කන්‍යාභාවය ආරක්ෂා කර ගැනීමට කටයුතු කර ඇති බව දක්වයි. එමගින් සමාජය තුළ ස්වයං පාලනයක් සිදුව ඇත.

ව්‍යභිචාරී තහංචිවලදි ලිංගික සබඳතා සඳහා විශේෂයෙන්ම සමාජ සම්මත පවතී. ඒ පිළිබඳව මෙම ප්‍රදේශයේ කරන ලද අධ්‍යයනයේ දි ව්‍යාභිචාරී තහංචි සහිත වූ ලිංගික සබඳතා කිහිපයක් හඳුනාගත හැකි විය.




**රූපසටහන 2.** අධ්‍යයන ප්‍රදේශයේ සිදු වී ඇති ව්‍යාභිචාරයන්

සමස්තයක් ලෙස අධ්‍යයන නියැදියේ සිදුව ඇති ව්‍යභිචාරයන් ප්‍රතිශතයක් ලෙස 10% කි. එම සිදුව ඇති ව්‍යභිචාරයන් වෙන් වෙන් වශයෙන් උක්ත ප්‍රස්තාරයට අනුව පෙන්වාදිය හැකි වේ. ඒ අනුව, අධ්‍යයන නියැදියේ එක් ගෘහස්ථයක අඹු සැමියන් ලෙස ජීවත්වන සහෝදරයෙකු සහ සහෝදරියක හඳුනා ගැනීමට හැකි විය. එහි දි සහෝදරයා මෙම සහෝදරියට විවාහයක් සිදු කර ගැනීමට නොදි තම අවශ්‍යතා සඳහා සහෝදරිය තබාගෙන සිටි බව හඳුනා ගත හැකි විය. මෙම අවස්ථාවන් අධ්‍යයන ප්‍රදේශය තුළ ප්‍රසිද්ධ ය. එනම්, ඔවුන් පිළිබඳ ව එම සිදුවීම පිළිබඳව අධ්‍යයන ප්‍රදේශයේ ප්‍රසිද්ධ ය.

එමෙන්ම තවත් ගෘහස්ථ ඒකකයක මහලු මවට තම පුතා විසින් ලිංගික කාර්යයන් සිදු කර ඇති බවට ද දත්ත ලබා දුනි. එම දත්ත දායිකාව පවසන පරිදි තම පුතා තදින් මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූ පුද්ගලයෙකු නිසා මෙම තත්ත්වයට පත් වී ඇති බව ඇයගේ අදහස යි. එම නිසා එම ගෘහස්ථ ඒකකය තුළ සිටි මහලු කාන්තාව මෙම තොරතුරු සැඟවීමකින් තොරව ඒ පිළිබඳව එතරම් තැකීමකින් තොරව දත්ත ලබාදීම විශේෂයකි. එමඟින් පෙනී යන්නේ ඔවුන්ට එවැනි කරුණු සාමාන්‍ය වී ඇති බව යි. ඥාතිත්වය පිළිබඳව කිසිදු තැකීමක් ඔවුන්ට නැති බව පෙනී යයි. මීට අමතරව අධ්‍යයන ප්‍රදේශය තුළ මව හා පුතු අතර සිදු වූ ව්‍යභාචාරී තහංචියක් පිළිබඳ ද අනාවරණය විය. එනම්, පුතා අධික ලෙස මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වී සිටීම තුළින් මවට යම් ලිංගික කාර්යයන් යම් අවස්ථාවන්වලදී සිදු කර ඇති බව පෙනේ. මෙම සිදුවීම ද අධ්‍යයන ප්‍රදේශයේ ප්‍රසිද්ධියට පත් වූ සිදුවීමකි.

මීට අමතරව අධ්‍යයන නියැදියේ ගෘහස්ථයක පරම්පරා දෙකක් අතර සිදු වූ ලිංගික සබඳතාවක් හඳුනා ගැනීමට හැකි විය. දත්ත දායිකාවක් අදහස් දැක්වූයේ තමාගේ බාල සහෝදරයා සමඟ තම දියණිය ප්‍රේම සබඳතාවක් ඇති කරගෙන ඔවුන් අඹු සැමියන් ලෙස කාලයක් ජීවත් වූ බව යි. විශේෂත්වය නම් මෙම දත්ත එම දත්ත දායකයන් නොපැකිලිව ලබාදීමයි. එමෙන්ම මෙම සියලු අවස්ථාවල දත්ත ලබාදීම සිදු කළේ මෙම ව්‍යභිචාරී තහංචි කඩ කළ පුද්ගලයන් නොව ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් ය. මෙමවැනි සිදුවීම් හමුවේ එම පුද්ගලයන් තම පවුල්වලින් දුරස් කර ඇති බව ඔවුන් දක්වයි. මෙම සිද්ධීන් අධ්‍යයන ප්‍රදේශය තුළ ප්‍රසිද්ධ වී ඇති නිසා ඔවුන් තොරතුරු සැඟවීමක් සිදු නොකරයි. මෙවැනි ව්‍යභිචාරී තහංචි කඩ කිරීම තුළින් එය තම පවුලට අවනම්බුවක් ලෙස ඔවුන් දක්වයි. ඒ අනුව පෙනී යන්නේ අධ්‍යයන ප්‍රදේශයේ ව්‍යභිචාරී තහංචි සිදුවන බවත් ක්‍රියාත්මක වන බවත් ය. මෙම ප්‍රදේශයේ පමණක් නොව සෑම සමාජයක ම පාහේ වර්තමානය වන විට ව්‍යභිචාරී තහංචි සිදුවීමේ ප්‍රවණතාවක් ගෙන ඇත.

මීට අමතරව අධ්‍යයන නියැදියේ ඇතැම් ගෘහස්ථ ඒකකයන්හි දත්ත දායකයන් අදහස් දැක්වූ පරිදි පූර්ව වෛවාහික ලිංගික සබඳතා, විවාහයෙන් පසු ඇතිවන අනියම් ලිංගික ඇසුර ද සමාජ ධර්මතා බිඳ දමන නුසුදුසු කරුණු බව යි. විවාහයට පෙර ලිංගිකව එකතු වීමෙන් විවාහයේදී කන්‍යාභාවය ඔප්පු කිරීමට නොහැකි වේ. එමෙන්ම එමඟින් ගැබ් ගැනීමක් සිදු වූ විට සමාජ අපවාදයට සමාජයේ ගැරහුමට මෙන්ම ගබ්සා වැනි තත්ත්වයන්ට ද වර්තමාන සමාජය තුළ බොහෝ වශයෙන් දැකගත හැකිබව දත්ත දායකයන් අදහස් දක්වයි. එපමණක් නොව පූර්ව වෛවාහික ලිංගික ඇසුර හේතුවෙන් අවජාතක දරු උපත් සිදුවන අවස්ථා ද අද වන විට වැඩි ප්‍රතිශතයක් ගන්නා බව ඔවුන්ගේ අදහස යි.

## 4. නිගමන හා යෝජනා

පවුල, විවාහය, ඥාතිත්වය සාම්ප්‍රදායික සිංහල සමාජයේ සමාජ පැවැත්ම සඳහා විශාල කාර්යභාරයක් ඉටු කෙරුණි. එමඟින් පුද්ගලයා සමාජය තුළ ජීවත්වීමේ දි විවිධ සබඳතා ඇති කර ගනු ලබයි. එම සබඳතා ඇතිවීමේ දි සිදු නොකළ යුතු, සිදු නොවිය යුතු, නොපැවැත්විය යුතු යැයි සමාජ සම්මත අවස්ථා ඇත. එවැනි සම්මත ව්‍යභිචාරයන් සිදුවීම වළක්වා ගැනීමට සමාජ ධර්මතා විශේෂයක් ලෙස ව්‍යභිචාරී තහංචි ක්‍රියාත්මක වේ. මනුෂ්‍යයාගේ ප්‍රාථමික අවශ්‍යතාවක් වන ලිංගික අවශ්‍යතා සඳහා අවශ්‍ය පාලනය මෙමඟින් සිදු කරයි. ක්ෂේත්‍ර පර්යේෂණය සිදු කළ අංක 62 අරුග්ගම්මන ග්‍රාමසේවා වසම අතීතයේ සිට ග්‍රාමීය ප්‍රදේශයක් ව පැවති බව අධ්‍යයන නියැදියේ වැඩිහිටි පරම්පරාවෙන් දැන ගත හැකි විය. නමුත් වර්තමානය වන විට මෙම අධ්‍යයන ප්‍රදේශයේ පවුල් ඒකකවල සාමාජික සංඛ්‍යාව සහ පවුල් ඒකකවල ස්වභාවය ගත් විට පෙනී යන්නේ මෙම ප්‍රදේශය වර්තමානය වන විට ග්‍රාමීය මට්ටමින් කෙමෙන් වෙනස් වෙමින් පවතින බවයි. මෙයට හේතුව වන්නේ අධ්‍යයන ප්‍රදේශය ශීඝ්‍ර ලෙස නවීකරණයවීම හරහා පවුල් ඒකකවල මෙන්ම ග්‍රාමසේවා ප්‍රදේශය තුළම කෙමෙන් ග්‍රාමීය ලක්ෂණ නොපැවතීමයි. එනම්, අධ්‍යයන ප්‍රදේශයේ 68% ක්ම පැවැතියේ න්‍යෂ්ටික පවුල් ක්‍රමය යි. සංකීර්ණ න්‍යෂ්ටික පවුල් ද 18% ක් වූ අතර, අවම ප්‍රමාණයක් ලෙස 14% ක ප්‍රතිශතයක් විස්තෘත පවුල් ක්‍රමය ක්‍රියාත්මක විය. එමෙන්ම පවුල් ඒකකවල සාමාජික සංඛ්‍යාව ගත් විට උපරිම සාමාජිකයන් හත් දෙනෙකු සිටින පවුල් තුනක් වැනි ඉතා අවම ප්‍රමාණයක් ඇත. ප්‍රදේශය තුළ බහුලව ම හඳුනාගත හැකි වූයේ සමාජිකයන් පහක් සිටින පවුල් ය. එමඟින් නිගමනය කළ හැකි වන්නේ වර්තමානයවන විට ප්‍රදේශය සංවර්ධනය වීම සඳහා සිදුවන නවීකරණයත්, සමාජ මාධ්‍ය, තාක්ෂණය මෙන්ම සංස්කෘතික විසරණය හරහා සිදුවන බටහිර සංස්කෘතික විසරණය හරහා සිදුවන බටහිර සංස්කෘතීන්වල ආභාසය වැඩි වී සිදුවන බටහිරකරණය වැනි සමාජ සංස්කෘතික වෙනස්වීමේ බලවේග ඔස්සේ අධ්‍යයන ප්‍රදේශය තරමක් දුරට අර්ධ නාගරික ලක්ෂණ පෙන්නුම් කරන බව යි.

එමඟින් විස්තෘත පවුල් ක්‍රමය වර්තමානය වන විට කෙමෙන් අභාවයට යාමෙන් සමාජ ධර්මතා පවුල තුළ බාල පරම්පරාවලට ලබාදීමට වැඩිහිටි පරම්පරාවට නොහැකි වේ. එමනිසා මෙම බටහිරකරණය, නාගරිකකරණය සහ නවීකරණය වැනි සමාජ ධර්මතා ප්‍රදේශය තුළින් කෙමෙන් වියැකී යාම ආරම්භව ඇති බව නිගමනය කළ හැකි ය. අධ්‍යයන ප්‍රදේශයේ ජනතාවගේ පදිංචිය විමසීමේ දි පැහැදිලි වූයේ 69% ක් ම මෙහි උපන්දා සිට ජීවත් වූ මුල් පදිංචිකරුවන් බව ය. මීට අමතරව ප්‍රදේශය තුළ වසර 10 කට හෝ 5 කට පෙර පදිංචියට පැමිණ නැත. ඔවුන්ගේ පදිංචිය තීරණයවීමට විවාහය, ඥාතිත්වය හා පරම්පරාව යන සාධක බලපා ඇති බව නිගමනය කළ හැකිය. එමෙන් ම ප්‍රදේශය තුළ මෑත කාලීනව ජනාවාසවීමක් සිදු වී නැති බව දැනට ප්‍රදේශය තුළ ජීවත් වන බහුතරය මෙම ප්‍රදේශයේ මූලයන් හේතුවෙන් අතීත හා වර්තමාන විවාහ චාරිත්‍ර හා ව්‍යභිචාරී සබඳතා පිළිබඳව මූල තොරතුරු ලබා ගත හැකි බව නිගමනය කළ හැකි ය.

එමෙන්ම මෙම අධ්‍යයන ප්‍රදේශය තුළ විවාහ තහංචි ක්‍රියාත්මක වන්නේ විවාහ සිරිත්-විරිත්, විවාහ සම්බන්ධතා හා ලිංගික සම්බන්ධතා සමඟ ය. එමඟින් නිගමනය කළ හැකි වූයේ අතීතයට සාපේක්ෂව අධ්‍යයන ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වූ විවාහ තහංචි හා ව්‍යභිචාරී තහංචි වර්තමානය වන විට වෙනස්වීමට ලක් වී ඇති බව යි. හඳහන් ගැලපීම අවමවීම මඟින් නුසුදුසු සබඳතාවලට පෙළඹීමේ ප්‍රවණතාව වැඩි වී ඇත. එමෙන් ම යෝජිත විවාහ අතීතයට සාපේක්ෂව අවමවීම හරහා කපු මහතාගේ කාර්යභාරය අවම වී ඇති බව නිගමනය කළ හැකිය. කපු මහතාගේ කාර්යභාර්ය වර්තමානය යන විට තාක්ෂණයේ දියුණුව, සමාජ නවීකරණය හා බටහිරකරණය වීම යටතේ තාක්ෂණික මෙවලම්, සමාජ මාධ්‍ය, පුවත්පත් අතිරේක හා විවිධ වෙබ් අඩවි මඟින් සිදු කරනු ලබන බව නිගමනය කළ හැකි ය.

මීට අමතරව විවාහය සඳහා අතීතයේ මෙන් කුලය ගැලපීම, ජාතිය, ආගම, හඳහන් ගැළපීමට වඩා මිළ මුදල්, දේපළ පිළිබඳ සලකා බැලීම අධ්‍යයන ප්‍රදේශයේ වැඩි ප්‍රවණතාවක් ගෙන ඇති බව නිගමනය වේ. එමෙන් ම විවාහයේ දි ඥාතිත්වය පිළිබඳ සලකා බැලීම ද වර්තමානය වන විට තරමක් නොසලකා හැර ඇති බව පෙනී යයි. එමඟින් වර්තමානය වන විට නොකළ යුතු, නොපැත්විය යුතු සබඳතා අධ්‍යයන ප්‍රදේශය තුළ කෙමෙන් වර්ධනය වන බව නිගමනය කළ හැකිය. මීට අමතරව අධ්‍යයන ක්ෂේත්‍රයේ ව්‍යභිචාරී විවාහ සබඳතා සහ ව්‍යභිචාරී ලිංගික සබඳතා පිළිබඳව හඳුනා ගැනීමට හැකි විය. එමඟින් නිගමනය කළ හැකි වන්නේ වර්තමාන සමාජය තුළ ව්‍යභිචාරී තහංචි නොසලකා හරිමින් තහංචි බිඳ දමමින් කටයුතු කරන පිරිස් ද සිටින බවයි. මෙවැනි සබඳතා ඇතිවීමට ඉඩ ලබාදීම හරහා කෙමෙන් සමාජය අශිෂ්ට තත්ත්වයට පත් වේ.

එමෙන්ම වර්තමානය වන විට පූර්ව වෛවාහික ලිංගික සබඳතා, අනියම් ලිංගික සබඳතා, සමලිංගික සබඳතා වැඩිවීමේ ප්‍රවණතාවක් ඇත. මෙවැනි සබඳතා මඟින් අවජාතක දරු උපත්, ගබ්සාව, ගණිකා වෘත්තිය වැඩිවීම වැනි සමාජ ගැටලු ද පැණනගියි. එවැනි ව්‍යභිචාරී සබඳතා ඇති කර ගැනීමෙන් ලැජ්ජාවට පත්වීම හරහා සියදිවි නසා ගැනීම, එවැනි අය කොන් කිරීම, ප්‍රදේශයෙන් පවුලෙන් ඉවත්කිරීම වැනි අවස්ථා නිර්මාණය වේ. මේ සඳහා බලපාන්නේ සංස්කෘතියේ ද්විත්ව ස්වභාවය යි. එනම් එක් අතකින් ධර්මතා ආරක්ෂා කිරීමට පෙළඹීමක් නොමැති පසුබිමක එවන් ධර්මතා ආරක්ෂා වනු ඇතැයි අපේක්ෂා කිරීම යි. අධ්‍යයනයේදි අදහස් දැක් වූ අය අතුරින් 98% ක පිරිසක් ව්‍යාභිචාරී තහංචි සමාජය තුළ ක්‍රියාත්මක වීම මඟින් සමාජය පාලනයවීම සිදුවන බව ප්‍රකාශකිරීම එයට සාක්ෂ්‍යයකි. එමඟින් නිගමනය කළ හැකි වන්නේ ව්‍යභිචාරී තහංචි වැනි සමාජ ධර්මතා සමාජ පාලනය සඳහා අත්‍යවශ්‍ය බව යි.

විවාහ චාරිත්‍රවල එන ව්‍යභිචාරී තහංචි මඟින් සිදු වූ සමාජ පාලනය නැවත සමාජය තුළ ඇති කිරීමට හා එහි වටිනාකම පිළිබඳ සමාජයට පණිවිඩ ලබා දීමට යොදාගත හැකි ප්‍රබල මාධ්‍යයක් ලෙස සමාජ මාධ්‍ය දැක්විය හැකි යි. වර්තමානයේ සමාජ මාධ්‍යය වැඩිහිටි, තරුණ සහ ළමා යන සෑම වයස් කාණ්ඩයකම අය බහුල ලෙස භාවිත කරයි. එමඟින් ඇතැම් අවස්ථාවල ධර්මතා පිරිහෙන, නොකළ යුතු සබඳතා, අසභ්‍ය දර්ශන ආදිය ද ප්‍රචාරය වේ. එමඟින් ධර්මතා, තහංචි පිරිහීමට ලක් වේ. එම නිසා ඥාතිත්ව සංකල්පයත්, විවාහ චාරිත්‍ර හා ව්‍යභිචාරී තහංචි මඟින් ඇති වන සමාජ පාලනය හා එහි දායකත්වය පිළිබඳ සමාජ මාධ්‍ය, ජනමාධ්‍ය මඟින් දැනුවත් කිරීමට කටයුතු කිරීම ඉතා වැදගත්වේ. ඥාතිත්වය, විවාහය, ව්‍යභිචාරී තහංචි, ධර්මතා, අඟනාකම්, පිළිබඳව කෙරෙන මෙවැනි පර්යේෂණ ඉතා අල්ප වේ. මෙවැනි පර්යේෂණ නිතර සිදුකිරීම මඟින් ඥාතිත්වය, සමාජ ධර්මතා පිළිබඳව සමාජය දැනුවත් කිරීමට හා වියැකී යන සමාජ ධර්මතා නැවත ස්ථාපිත කිරීමට අවස්ථාව උදාවේ. නූතන තරුණ හා බාල පරම්පරාව අතර සමාජ ධර්මතා, අඟනාකම් සහ ඥාතිත්වය ඇති වටිනාකම පිළිබඳ ව දැනුවත්භාවයක් නිසියාකාරව දැකගත නොහැකිය. එමනිසා මොවුන් අතින් ව්‍යභිචාරී සබඳතා ඇති වී තහංචි කඩ කරන පුද්ගලයන්

බහුල විය හැකිය. අනාගතයේ වැඩිහිටියන් බවට පත් වූ විට ද ධර්මතා ඊළඟ පරම්පරාවට දායාද කිරීමට අවස්ථාවක් නොමැත. එම නිසා පාසල, පන්සල, ආගමික ස්ථාන මෙන්ම පවුල වැනි සමාජ ආයතන මගින් සමාජ ධර්මතා, අඟනාකම්, ඥාතිත්ව සංකල්පයෙහි වටිනාකම පිළිබඳ ව නූතන තරුණ පරම්පරාවට ඉගැන්වීම අතයවශ්‍ය වේ.

සහෝදර සහෝදරියන්, ඥාති සහෝදර සහෝදරියන්, තම උපත ලද පවුලේ අය අතර, පරම්පරා දෙකක් අතර හා ලේ ඥාතීන් අතර විවාහ හා ලිංගික සබඳතා සිදුවීම ශිෂ්ට සම්පන්න එකක් නොවේ. එවැනි තත්ත්වයන් මගින් සමාජය තුළ ලැජ්ජාවට, අපවාදයට ලක් වේ. එමෙන් ම එමගින් විකෘති, රෝග සහිත දරුවන් බිහි වේ. එම නිසා මෙවැනි කරුණු පිළිබඳ ව සමාජය දැනුවත් කිරීම කළ යුතු ය. වර්තමාන සමාජයේ බහුල වශයෙන් අනියම් සබඳතා, පූර්ව වෛවාහික ලිංගික සබඳතා, ගණිකා වෘත්තිය වැඩිවීම වැනි සිදු නොවිය යුතු සබඳතා නොහොත් ව්‍යභිචාරියන් සිදු වේ. එමගින් ගබ්සාව, ලිංගාශ්‍රිත රෝග, ලිංගික අපරාධ, සියදිවි නසාගැනීම, මිනී මැරුම් වැනි ගැටලු රැසක් නිර්මාණය වේ. එම නිසා පාසල් අධ්‍යාපනය තුළදිම නිසියාකාර ලිංගික අධ්‍යාපනයක් ලබා දීම, සෞඛ්‍ය අධ්‍යාපනය නගා සිටු වීම, ආගමික ස්ථානවලින් ධර්මතා පිළිබඳ ව දැනුවත් කිරීම වැනි ක්‍රියා මාර්ග ගැනීම.

වර්තමානය වන විට විවාහ චාර්ත්‍ර හා විවාහයට ඇති වටිනාකම අඩු වී ඇත. එමගින් ව්‍යභිචාරී සබඳතා වැඩි වී, දික්කසාද අවස්ථාවන් ද වැඩි වී ඇත. විවාහ චාරිත්‍රවල සිරිතට මුල් තැන නොදී විවාහ උත්සවය විචිත්‍රවත් කිරීමට උත්සාහ දරයි. එම නිසා නව්‍යකරණය වූ විවාහ චාරිත්‍රවල යහපත් කොටස ලබාගෙන, විවාහය, විවාහ චාරිත්‍රවල වටිනාකම පිළිබඳ දෙමව්පියන්, වැඩිහිටියන්, ජ්‍යෝතිෂ්‍යවේදීන් මගින් නූතන පරම්පරාව දැනුවත් කිරීම ඉතා වැදගත් වේ. වර්තමානයේ පවුලට ඇති වටිනාකම අඩු වී ඇත. මිළ මුදල් පසුපස හඹා යාම වැඩි වීමෙන් ඥාති සබඳතා නොසලකා හරිමින් සිටියි. එමෙන්ම සිදු වී ඇති වාණිජකරණය හා බටහිරකරණය මගින් විස්තෘත පවුල් ක්‍රමය ශීඝ්‍රයෙන් වියැකීයමින් ඇත. එම නිසා පවුලක ඇති වටිනාකම වැඩිහිටියන් මැදිහත් වී දරුවන්ට, නූතන පරම්පරාව දැනුවත් කිරීම මෙන්ම විස්තෘත පවුල නැවත ඇති කිරීම. නූතන ජනමාධ්‍ය, සමාජ මාධ්‍ය, විවිධ වෙබ් අඩවි මගින් සමාජයට ලබාදෙන ධර්මතා, අඟනාකම් විනාශ වන අන්දමේ වැරදි පූර්වාදර්ශයන් වැළැක්වීමට කටයුතු කිරීම අත්‍යාවශ වේ. මේ ආකාරයට විවාහ චාරිත්‍රවල එන ව්‍යභිචාරී තහංචි මගින් සිදුවන සමාජ පාලනය නැවත ඇති කිරීමට ගත හැකි ක්‍රියාමාර්ගයන් පිළිබඳ ව යෝජනා කිහිපයක් ඉදිරිපත් කළ හැකි ය.

## 5. ආශ්‍රිත ග්‍රන්ථ


අබේසුන්දර, පී. (2002). *මානව සමාජගත පවුල් සංකල්ප*. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ. කොළඹ 10.

ආරියපාල, එම්. බී. (1996). *මධ්‍යකාලීන ලංකා සමාජය*. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ. කොළඹ 10.

ජයතුංග, එන්. (2005). *විවාහය පිළිබඳ සමාජ විද්‍යාත්මක විමසුමක්*. සමන්ති පොත් ප්‍රකාශකයෝ. ජා ඇල.

පල්ලියගුරු, සී. (2003). *සංස්කෘතිය, සමාජය සහ පෞරුෂය*. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ. කොළඹ 10.

පිරිස්, ආර්. (2012). *සිංහල සමාජ සංවිධානය*. විසිදුන ප්‍රකාශකයේ. බොරලැස්ගමුව.

සමරසේකර, එස්. (2005). *මානව විද්‍යා මූලධර්ම*. කර්තෘ ප්‍රකාශන. නුගේගොඩ.

හෙට්ටිආරච්චි, එස්. බී. (2008). *ලංකාවේ සමාජ හා සංස්කෘතික ඉතිහාසය*. කර්තෘ ප්‍රකාශන. නුගේගොඩ.

හේරත්, ආර්.ඩී.එම්.එච්. (1999). *ඥාතීත්වය*. තරංජි ප්‍රින්ට්ස්. මහරගම.

Ariyapala, M. B. (1954). *Succession to the Throne in Ancient Ceylon*. Society in Mediaeval Ceylon. Colombo.

Bell, D. (1988). *Wealth Trnsfers Occasioned By Marriage: A Comparative Reconsideration.* Cambridge University Press. New York.

Crapo, R. H. (1993), *Cultural Anthropology*, 3rd ed., U.S.A.: The Dusking Publishing Group.

Davis, K. (1949), *Human Society*, New York: The MacMillan Co.

Dominian, J. (1968). *Marital Break Down*. Franciscan Herald Press. United States.

Ellawala, H. (1969). *Social History of Early Ceylon*. Department of Cultural affairs. Colombo.

Freud, S. 1918. Totem and taboo, translater. A. A. Brill. Yard and Company.

Friedl, Joho. (1976), Cultural Anthropology, New York: Haper & Row Publishers.

Fox, R. (1967). *Kinship and Marriage*. Penguin Book. England.

Ogburn, W.F. & Nimcoff, M.F. (1947). *A Handbook Of Sociology*. Trubner & Company Limited. London.

Pritchard, E. (1951). *Kinship and Marriage among the Nuer*. Clarendon Press. London.

Routine, D. (1951). *Notes and Queries on Anthropology*. Routledge and Paul. London.

Satlow, M. L. (2020). *Incest Restrictions*. In Tasting the Dish: Rabbinic Rhetorics of Sexuality .Brown Judaic Studies. Retrieved July 2, 2023 from https://doi.org/10.2307/j.ctvzpv5s5.7 .

Schusky, Ernest L., (1965), *Manual for Kinship Analysis*, New York: Holt, Rinehart and Winston.

Simpson, B. (1999). *The Kinship Consequences of Posthumous Reproduction: Diane Blood versus The Human Fertilisation and Embryology Authority.* University of Durham. England.